# ස්වයං අධ්‍යයනයට අත් වැලක්

❖ ශ්‍රේණිය : 7 ශ්‍රේණිය
දෙවන වාරය

❖ නිපුණතාවය 6.4 : විවිධ ජනවර්ග හා බැඳී සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

❖ ක්‍රියාකාරකම 6.4 : විවිධ ජනවර්ග හා බැඳී සංස්කෘතික උත්සව අගයමු.

## රාමසාන් උත්සවය



සැකසුම : එච්. ඒ. ලලන්තිකා ජයසිංහ
මහා/වත්/ ලියන්ගස්වගුර ආදර්ශ කනිෂ්ට විදුහල
පන්විල

මෙහෙයවීම : නර්තන අංශය
වත්තේගම අධ්‍යාපන කලාපය

උපදෙස්: මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩි දුරටත් අධ්‍යයනය කිරිම සඳහා පාසැල් ගුරු ඇසුර ලබා ගත යුතුය.

## හැඳින්වීම

ඔබ මේ වනවිට පාසලේ 6 ශ්‍රේණියේදී විවිධ ජනවර්ග හා බැඳී උත්සව යටතේ ෛතපොංගල් උත්සවය, වෙසක් උත්සවය සහ නත්තල් උත්සවය පිළිබඳ කරුණු හදාරන්නට ඇත.

මෙම පාඩමෙන් අප බලාපොරොත්තු වන්නේ

මුස්ලිම් ජාතිකයන් උත්සවශ්‍රීයෙන් සමරනු ලබන රාමසාන් උත්සවය සම්බන්ධ තොරතුරු හඳුනා ගැනීමටය. මෙහිදී එම උත්සවය පැවැත්වීමට හේතු , සංස්කෘතික ලක්ෂණ සහ එම උත්සවය හා බැඳී කලාත්මක අංග ආදිය පිලිබඳව ඔබට හඳුනා ගැනීමට ලැබෙනු ඇත.



# රාමසාන් උත්සවය

විවිධ ජන වර්ග විසින් පවත්වනු ලබන උත්සව අතර **අරාබිය, මැලේසියාව, ඉන්දුනීසියාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව** ආදී රටවල වෙසෙන ඉස්ලාම් බැතිමතුන් විසින් රාමසාන් උත්සවය පවත්වනු ලැබේ.

මුස්ලිම් ආගමික නීතියට අනුව සෑම ඉස්ලාම් භක්තිකයෙකු විසින්ම අනිවාර්යයෙන් රැකිය යුතු **"උපවාස සීලය"** හෙවත් **"නෝම්බි ඇල්ලීම"** මසක් පුරා ආරක්ෂා කර අවසන් කරන දිනය **රාමසාන් දිනය** ලෙස හැදින්වේ. මෙය **රාමලාන්, රාමඩාන්** ආදී නම්වලින්ද හඳුන්වනු ලැබේ.



## පවත්වන කාලය :

වසරකට වරක් සිදු කෙරෙන මෙම නෝම්බි ඇල්ලීම නොහොත් උපවාස කාලය, ජුනි මාසයේ පොහොය දින සඳ බැලීමෙන් ආරම්භ වන අතර යලි ජුලි මාසයේ පොහොය දින සඳ බැලීමෙන් අවසන් වේ.



## රාමසාන් උත්සවය පැවැත්වීමට හේතු :

- ඉස්ලාම් භක්තිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය වන " අල් කුර් ආනය" ලොව පහළ වූ කාලය සිහිපත් කිරීම සඳහාත්
- ඉස්ලාම් බැතිමතුන්ගේ සමගිය වර්ධනය වීමටත් ආගමික හා ජාතික වශයෙන් එක්වී දියුණුවීම සඳහාත් මෙම රාමසාන් උත්සවය පවත්වනු ලැබේ.

ඉස්ලාම් භක්තිකයන් මෙය " අල්ලාහ් දෙවියන්ගෙන්" ලැබුණු ආදර්ශයක් ලෙස සලකති.



## විශේෂ ලක්ෂණ:

- වයස අවුරුදු 07 ට අඩු දරුවන්, ශරීර ශක්තියෙන් දුර්වල රෝගීන් සහ වයස්ගත වුවන් හැර ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සෑම ඉස්ලාම් භක්තිකයෙකු විසින්ම අනිවාර්යයෙන් උපවාස ශීලය රැකිය යුතුය.
- අල්ලාහ් දෙවියන්ගේ ආශිර්වාදය මත මේ කාලයේ දුප්පත් පොහොසත් භේදයකින් තොරව පිළියෙළ කර ගන්නා **ආහාර,** ධන ධාන්‍ය හා ඇදුම් පැලදුම් බෙදා ගැනීම සිදු කරති.
- බොරු කීම, මත පැන් පානය කිරීම වැනි දුසිරිතෙන් **වෙන්වී** මානසික හා කායික සංවර බවින් යුතුව මෙම උපවාස **කාලය** ගත කරති.





## රාමසාන් උත්සවය හා බැඳී චාරිත්‍ර :

- උදෑසන හිරු උදාවත් සමග ප්‍රථම යාච්ඤාවෙන් ආරම්භ කෙරෙන උපවාසය හිරු බැස ගිය පසු අවසන් කෙරේ.
- ඉන් අනතුරුව ආහාර පිළියෙළ කරගෙන දවසේ එකම ආහාර වේල අනුභව කරති.
- මෙම උපවාස කාලය ආගමික කටයුතු සදහා වෙන්වූ මාසයක් බැවින් හක්තියෙන් සහ කැපවීමෙන් වැඩි කාලයක් ආගමික කටයුතු සදහා යොමු වෙති.
- ජුලි මාසයේ පොහොය දින සද බැලීමෙන් නෝම්බි ඇල්ලීම අවසන් වූ පසු සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර මෙන් නෑදෑ හිතවතුන්ගේ නිවෙස් වලට යෑම සිදු කෙරේ.





# රාමසාන් උත්සවය හා බැදී සැරසිලි සහ සංස්කෘතිකාංග:

- රාමසාන් දිනයන් වලදී ඉස්ලාම් භක්තිකයන් තම නිවෙස් විසිතුරු සැරසිලි වලින් අලංකාර කරති. ඒ සදහා ඔවුන් සුබපැතුම් සහිත කොඩි වැල්, විසිතුරු පහන් කූඩු, වර්ණවත් ඉටි පන්දම් ආදිය යොදා ගනිති.







- සුබ පැතුම් සහිත සුබ පැතුම් පත් හුවමාරු කර ගනිති.




- කාන්තාවන් තම දෑත් විසිතුරු රටාවන්ගෙන් අලංකාර කර ගන්නා අතර

  කුඩා දරුවන් සහ වැඩිහිටියන් ගිනිකෙලි සමග සතුටු වීම ද

  දැකිය හැක.




## කලාත්මක අංග :

- ඉස්ලාම් ආගම ප්‍රධාන ආගම වන රටවල් වන ඉන්දුනීසියාව, මැලේසියාව,අරාබිය වැනි රටවල රාමසාන් උත්සවය, උත්සවශ්‍රීයෙන් පවත්වනු ලබති. ඔවුහු නගර වීදිවල පෙරහැරවල් පවත්වන  අතර එම පෙරහැරවල්වල කුඩා දරුවන් ගීත ගයමින් යති. වැඩිහිටියන් වාදන භාණ්ඩ වයමින් ගීත ගයති. වේදිකා තනවා සංගීත ප්‍රසංග පවත්වති.





- කුඩා ප්‍රමාණයේ රබානක් වයමින් කෙටි මාත්‍රා භාවිතා කරමින් පුරුෂයින් විසින්  සිදු කෙරෙන රබන් නැටුමක් නටන නමුත් ශ්‍රී ලංකාව වැනි රටවල එයද සුලබව දැකිය නොහැකිය.



- කාන්තාවන් නර්තන අංග සඳහා සම්බන්ධ නොවන අතර ඔවුන් ආගමික ස්තෝත්‍ර ගායනා කිරීම සිදුකරති.